යම් පුවතකට සෘජුව අදාළ නොවන විටකදී, එම පුවතට සම්බන්ධ වන අයෙකුගේ වාර්ගිකත්වය සඳහන් නොකරන ලෙසින් මාධ්‍ය ආචාර ධර්මයන් තුළ දැක්වේ. එවැනි ආචාර ධර්මයක් මාධ්‍ය සඳහා පැවතීමට හේතුව වන්නේ, ඒ ඔස්සේ යම් යම් වාර්ගිකත්වයන්ට අයත් ජන කොටස් කොන් කිරීමකට ලක්වීමේ හේතුව නිසායි. එසේම පුවතකට අදාළ නොවන විටක වාර්ගිකත්වය සඳහන් කිරීමේ භාවිතාවෙන් යම් යම් වාර්ගිකත්වයන් කොන් කිරීමකට ලක්වීම වඩාත් තීව්‍ර වන්නේ, අතිබහුතරයක් අවස්ථාවන් හිදී මෙසේ සඳහන් කෙරෙන්නේ සුළුතර වාර්ගිකත්වයන් සම්බන්ධයෙන් පමණක් වීමයි.

ඊට උදාහරණ ලෙසින් පහත පුවත් වාර්තාවන් දැක්විය හැක. එම අදාළ පුද්ගලයින් "මුස්ලිම් ජාතිකයින්" බව සඳහන් වීම මෙම පුවත් වාර්තාවන් සඳහා අදාළ වේ යැයි ඔබ සිතන්නේද? එසේ අදාළ නොවේ නම් එය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් නොවේද?

#MediaEthicsSL #lka #SinhalaPress #Mawbima